සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

| | |
|---|---|
| **තෙවන වාර පරීක්ෂණය 2017** | **06 ශ්‍රේණිය** |
| **மூன்றாம் தவணைப் பரீட்சை2017** | **தரம்06** |
| **Third Term Test 2017** | **Grade06** |

| | |
|---|---|
| **බුද්ධ ධර්මය - I කොටස** | **කාලය :-** **පැය දෙකයි** ***Two hours*** |

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. අප කරන වැඩ වැඩිහිටියන්ගේ උපදෙස් හා අනුමැතිය ඇතිව කළ යුතුය. මෙය බුදු දහමේ හඳුන්වන්නේ,
   i. වුද්ධානුමතං නමිනි.
   ii. සුතං නමිනි.
   iii. ධම්මානුවත්තී නමිනි.

2. ලෝක පරිසර දිනය යෙදී ඇත්තේ,
   i. ජූනි 03 වෙනිදා ය.
   ii. ජූනි 05 වෙනිදා ය.
   iii. ජූනි 06 වෙනිදා ය.

3. ඉස්සර සමණා විහාරය ලෙස හඳුන්වනු ලබන්නේ ,
   i. වෙස්සගිරිය යි.
   ii. චේතියගිරිය යි.
   iii. ඉසුරුමුණිය යි.

4. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ලංකාවට වැඩම කරන ලද්දේ කිනම් පොහෝ දිනකදී ද?
   i. උඳුවප් පොහෝ දිනය.
   ii. පොසොන් පොහෝ දිනය.
   iii. ඉල් පොහෝ දිනය.

5. ශීල ශික්ෂාවට අයත් අංග,

   i. 5 කි.

   ii. 8 කි.

   iii. 3 කි.

- ගැලපෙන පිළිතුර තෝරා යා කරන්න.

| | |
|---|---|
| 6. ගිහියාගේ නිත්‍ය ශීලය වන්නේ, | සිඟාලකට |
| 7. බුදුන් වහන්සේ යුතුකම් ඉටු කිරීම පිළිබඳව පැහැදිලි කර දුන්නේ, | මස මානවකයාය. |
| 8. ලක්දිව ඉදිවූ මුල්ම පන්සල, | පන්සිල් |
| 9. නිති සිල් රකිමින් තම ගම දියුණු කළේ, | හත්ථාලක මෙහෙනවර |
| 10. සඟමිත් තෙරණිය ඇතුළු භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් ඉදි කළ ආරාමය, | කාල පාසාද පිරිවෙන |

- පහත සඳහන් වගන්ති නිවැරදි නම් ( √ ) ලකුණ ද වැරදි නම් (× ) වැරදි ලකුණ ද ඉදිරියෙන් යොදන්න.

11. ශ්‍රී ලංකාවේ බුදු සසුනෙහි පැවදි වූ මුල්ම කාන්තාව මහානාග යුව රජුගේ බිසව වූ අනුලා දේවිය යි. (   )

12. සිදුහත් බෝසතුන් සත්‍යාවබෝධය සඳහා අවු. 08 ක් දුෂ්කර ක්‍රියා කළහ. (   )

13. මව් පිය උපස්ථානය සඳහා දරුවකු යොමු වීමේදී යුතුකම් 5 ක් ඉටු කළ යුතු බව බුදුන් වහන්සේ පැහැදිලි කර ඇත්තේ මංගල සූත්‍රයේදී ය. (   )

14. " සබ්බේ තසන්ති දණ්ඩස්ස " ගාථා ඇතුළත් වන්නේ පන්සිය පනස් ජාතක පොත් වහන්සේගේය. (   )

15. ලක්දිව බුදු දහම හඳුන්වා දීමට මූලික වූයේ ධර්මාශෝක රජුය. (   )

- හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

  (පිසුනාවාචා , ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලය, සම්මා ආජීව, අනිත්‍යතාව, අත්තූපනායික ධර්ම පරියාය, සතර බ්‍රහ්ම විහරණ)

16. ධාර්මික යහපත් ජීවන වෘත්තියක නිරත වීම ....................................... නමින් හඳුන්වයි.

17. වචනයෙන් සිදුවන වැරද්දකි ............................................

18. තමා උපමා කොට ගෙන අන් අයට වැඩ පිණිස හේතු වන ක්‍රියා කිරීම. ......................................... යි.

19. ජාතික කොඩියේ බෝපත් සතරින් නිරූපනය වන්නේ, .................................................. යි.

20. ලොව පවතින සෑම දෙයක්ම වෙනස් වීමට යටත් වේ. මෙය බුදු දහමේ හඳුන්වන්නේ .............................. නමිනි.

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Educationසබරගමුව

**තෙවන වාර පරීක්ෂණය 2017** | **06 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை2017** | **தரம்06**
**First Term Test 2017** | **Grade06**

**බුද්ධ ධර්මය - II කොටස**

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(01)

I ශාසනික වචන ලියන්න

- අතුරුපස ................................
- දිය නානවා .................................

II දැඩි ලෝභය විනාශයට හේතු වන බව පැහැදිලි කෙරෙන ජාතක කථාව නම් කරන්න.

III පස්වග මහණුන් නම් කරන්න.

IV තුසිත දෙව් ලොව වැඩ සිටි බෝසතුන්ට බුදු වීමට කාලය පැමිණ ඇතැයි ආරාධනා කළේ කවුද ?

V බුද්ධත්වය ලැබීමට පෙර දින රාත්‍රියෙහි සිදුහත් බෝසතුන් අවබෝධ කර ගත් සත්වයන්ගේ උප්පත්තිය හා මරණය දැන ගැනීමේ නුවණ හඳුන්වන නම කුමක් ද?

VI ජාතික ගීයේ නිර්මාතෘ කවුද ?

VII බුදුන් වහන්සේ විසින් " තංච කම්මං කතං සාධුයං කත්වා නානුතප්පති ˜ යන ගාථාව දේශනා කලේ කාගේ හොඳ ක්‍රියාවක් මුල් කර ගෙනද ?

VIII රාහුල තෙරුන් රහත් වූයේ කුමන සූත්‍රයක් ඇසීමෙන් ද?

IX ලක් දිව ජාතික වෘක්ෂය වන නා වෘක්ෂය පා මුල දී බුද්ධත්වයට පත් වූ බුදුන් වහන්සේ නමක් ලියන්න.

X සිදුහත් කුමරුට පිය රජුගේ දෙවන වැඳුම සිදු වන විට කුමරුගේ වයස කීයද ?

(ලකුණු 2 x 10 = 20)

(02) I “ සබ්බේ තසන්ති දණ්ඩස්ස - සබ්බේ භායන්ති මච්චුනෝ ˜ යන ගාථාව සම්පූර්ණ කරන්න. ( ල. 02 )

II එහි තේරුම ලියන්න. ( ල. 03 )

III තමා උපමා කොට ගෙන අන් අයට වැඩ පිණිස ක්‍රියා කිරීම තුළින් ශිෂ්‍ය ජීවිතයට ලැබෙන ප්‍රයෝජන 5 ක් ලියන්න. (ල. 05)

(03) I පරිසරයට අයත් අංග 4 ක් ලියන්න. (ල. 02 )

II පරිසරය දූෂණය වීමට හේතු වන මිනිස් ක්‍රියාකාරකම් 03 ක් ලියන්න. (ල. 03 )

III පරිසරය ආරක්ෂා කිරීම සඳහා බුදු දහමින් ලබා දුන් උපදෙස් 05 ක් ලියන්න. (ල. 05 )

(04) I මිහිඳු හිමි සමග ලක්දිවට වැඩි සාමණේරයන් වහන්සේ කවුද ? (ල. 02 )

II මිහිඳු හිමියන් තමන් ඇතුළු පිරිස තිස්ස රජුට හඳුන්වා දුන්නේ කෙසේද ? (ල. 03 )

III මහින්දාගමනය නිසා ලක්දිවට ලැබුණු දායාද 5 ක් නම් කරන්න. (ල. 05 )

(ල. 2, 3, 5)

(05) I සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කළ යුතු බව සාකේත නුවර සිටු දේවිය පැහැදිලි කර දුන්නේ කාටද ?

(ල. 02 )

II අංගුත්තර නිකායේ කුල සූත්‍ර යේ සඳහන් සම්පත් ආරක්ෂා කර ගැනීමට අදාළ උපදෙස් වලින් 3 ක් ලියන්න. (ල. 03 )

III පාසලේ සම්පත් ආරක්ෂා කර ගැනීම සඳහා පාසල් ශිෂ්‍යයකු ලෙස ඔබටද කළ හැකි දේවල් 5 ක් ලියන්න. (ල. 05 )

(06) I ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කරවීම හඳුන්වන නම කුමක්ද ? (ල. 02 )

II සංඝමිත්තා තෙරණිය ලක්දිවට වැඩම කරවීම සම්බන්ධ පහත තොරතුරු දක්වන්න.

- සඟමිත් තෙරණිය ලක්දිවට වැඩි ස්ථානය -
- ශ්‍රී මහා බෝධීන් වහන්සේ රෝපණය කළ ස්ථානය -
- සංඝමිත්තා තෙරණිය ලක්දිවට වැඩම කරවීම සඳහා ලක්දිවින් ගිය පිරිසේ ප්‍රධානියා -

(ල. 03 )

III බෝධි පූජා පැවැත්වීමේ අරමුණු 05 ක් ලියන්න. (ල. 05 )

(07) I ශ්‍රද්ධාව යනු කුමක්ද ? (ල. 02 )

II ශ්‍රද්ධාවේ ප්‍රභේද 02 ලියන්න. (ල. 03 )

III නියම ශ්‍රද්ධාවන්තයා සතු ලක්ෂණ 03 ලියන්න (ල. 05 )